# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/26 - 2023 දෙසැම්බර් මස 27 වැනි බදාදා - 2023.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/80(29)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**වෛද්‍ය රමේෂ් පතිරණ,**
සෞඛ්‍ය අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2023 පෙබරවාරි මස 14 වන දින අංක 2319/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 ආහාර (සීනි මට්ටම් සඳහා වර්ණ සංකේතවත් කිරීම - දියර) නියෝගවල 1 වන නියෝගය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''1. මේ නියෝග 2022 ආහාර (සීනි මට්ටම සඳහා වර්ණ සංකේතවත් කිරීම - දියර) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2025 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මකභාවයට පත්විය යුතු ය.''

EOG 12 - 0386